දෙපැත්ත

"මෙල්බර්න් වල ඒ පැත්ත - මේ පැත්ත කියලා පැති දෙකක් තියෙනවාද?" පන්හිඳ උදේ පාන්දර අපබ්‍රංශ ප්‍රශ්ණයක් ඇහුවා.

"ඔය කියන්නෙ "සබර්බ්ස්" ගැනද - නැත්තං "කවුන්සිල්" ගැනද? "නෑ - නෑ සිටි" එකෙන් එහා පැත්ත - මේහා පැත්ත කියලා?

"අනේ මන් දන්නෑ; අපි වැඩකරන තැනකවත් එහෙම වෙන් කිරිල්ලක් ගැන. අපි සමහරු ඒ පැතිවලට ගිහිල්ලා වැඩ කරනවා ඒ වැඩ සමහරක් තියෙන්නෙත් මේ පැත්තේ. ඇයි එහෙම ඇහුවෙ? පින්සල උනනදු වුණා.

"නෑ නිකං; අපේ සමහරු එහෙමත් බෙදිලා ! දැනුයි දන්නෙ....."

"තියෙන බෙදිලි මදිවට....." පින් කිව්වෙ ආරෝවට වාගෙ.

පන් - පින් ගේ වැඩවලට එහෙම සීමාවල් තිබුණෙම නෑ. ඒ කියා මෙල්බර්න් ද නැද්ද? ඔස්ට්‍රේලියාවෙද ලංකාවද කියන එක මොනම වැඩකටවත් හරස් කරගත්තෙ නෑ. "කවුරු කොහොම චෝදනා කළත් මේ පැත්ත කියල ඔය සමහර අය හිතාගෙන ඉන්න පැතිවල අය කරන සමහර දේවල් වලට අපිට තාම සම්මාදන් වෙන්නෙ, ඒ ගැන ලියන්න හම්බවෙලා නෑ. ඒ හින්දමයි මං ටිකටි දෙකක් ගත්තෙ තමුන්නැහෙත් එක්ක රංගන - උදුම්බරාලගෙ වැඩේ බලන්න යන්න....." පන් කිව්වේ ටිකක් හිතේ අමාරුවෙන් "මං නොදැන්නවයැ ඔහෙට තියෙන උණ" මොකක්ද කියලා....." පින් කිව්වේ සමච්චලයට වගේ. නැටුම් වලටත් වඩා ජන සංගීතය ගැන පන් ටිකක් උනන්දුයි. "රංගාභිෂේක 2 ත් එක්ක "හෙළ මියැසි රාවය" තියෙන බව පත්තරවල එහෙම අනිත් ලියන අය ලියලා තිබුණනේ.

උත්සවය බලලා දෙන්නා එක්ක ගෙදර ආවේ හරම සතුටින්.

"මං හිතුවා බෝරිං වෙයි වත්ද ඔහේට කියලා" පන් ඇහුවේ පින්ගේ අදහස් එළියට ගන්න හිතාගෙන.

"මං ඉතින් කොහොමත් නැටුම් වලට කැමතියි නේ ඒ හන්ද මට එහෙම වෙන්නෙ නෑ කොහොමත් !" ඒ පින් .

"ඔව් ඉතින් ගඳනු ළමයි දිහා බලං ඉන්න තියෙයිනං....."

"ඇයි පිරිමි නැටුවෙ නැද්ද? "

"අනික නැටුම් මට අදලයිනේ අඳින කරන වැඩවලට"

පින් ඉරියව් ගැන උනන්දුයි.

"දකින්නේ බලන්නේ නැතිව කොහොම ද අඳින්නෙ?"

ප්‍රසංගයේ නිවේදන කටයුතු කරපු ජගත් මුණසිංහ හිතවතාගෙන් එයාගේ විස්තර කරණයට හදගෙන තිබුණ සටහන් ටික පන් ඉල්ලගෙනයි ආවෙ කොයිකටත්, පන් ලියන්න පටන් ගත්තා.

මුලින්ම අප කතා කළ යුතුවන්නේ ප්‍රසංග යක් ඉදිරිපත් කරනා අය පිළිබඳවයි. මන්ද යත් ප්‍රසංගයේ මුහුණුවර ප්‍රේක්ෂකයින් මුලින්ම හඳුනාගන්නේ ඔහු හෝ ඇය හෝ ඔවුන් දෙපළගේම වේදිකා ප්‍රාප්තිය අනුවයි. අන් අය රැස්කරගත් හෝ රැස් කරදුන් සම්පත් මත නොරැදී තෙමේම පොත පත පරිශීලනය කරමින් අදල අයගෙන් දැනුවත් වෙමින් ගත් දෙයින් ප්‍රේක්ෂකයින් දැනුවත් කිරම පිළිබඳව ජගත් මුණසිංහ නිවේදකවරයා ප්‍රශංසාවට ලක්වීය යුතුය. එදිරිවීර සරත්චන්ද්‍රයන්ගේ "සිංහල ගැමි නාටකය" ඩබ්.බී. මකුලොළුව ශූරීන්ගේ "හෙළ ගී මඟ" ඩී.ද.එස්. කුලතිලකයන්ගේ ජන සංගීත/සිද්ධාන්ත මුදියන්සේ දිසානායකයන්-ගේ, සිංහල නර්ථන කලාව වැනි පොත පත තමා ඇසුරු කළ බවයි ඔහු අප වෙත කීයේ. සිංහලය මෙන්ම ඉංග්‍රීසිය සංවරව හසුරුවමින් කළ ඉදිරිපත් කිරීම ප්‍රශස්ථයි. භාෂා දෙකම හැසිරවීමේ හැකියාව මෙවන් රටකදී වැදගත්. ඒ නිසාවෙන් ම නිවේදිකාවකගේ අවශ්‍යතාවය තදින් නොදැනිණ.

"ඒ වුණාට ගෑණු ළමයෙකුත් උන්නනං තමයි අලංකාර! පින් ලියවිල්ලට හරස් කැපුවා. "එහෙම ලිව්වනං තමයි හොඳ !

"ඇයි උන්න ගැණු ළමයි මදිද? ඒ ඈයො අලංකාර මදි ද?" ළමයි උන්නෙ කීප දෙනෙයි නේද කියලා පන්වත් හිතුණා. ඒක එහෙමයි කියල තමයි අපි දකින්නේ. එත් දැන් ඉස්සරට වඩා පිරිමි ළමයින්ගේ දයකත්නවය වැඩි බවකුත් පේනවා.

ජයශ්‍රී චන්ද්‍රජිත් සහ එස්. කරුණාරත්න නාට්‍යවේදීන් දෙදෙනාගේ අධ්‍යක්ෂණයෙන් ප්‍රසංග යේ ප්‍රථම භාගය පිරැවූ "හෙළ මියැසි රාවය" මෙල්බර්න් ප්‍රෙක්ෂකයින්ට නැටුම් අත්දැකීමක් වූ බව නම් සත්‍යයක් . එක දිගට ගලා යන සේ ගැයුණ ජන කවි, ගායනා අතරේ ඒවා එකිනෙක යා කරවීමට යොදු ගත් දෙබස් බන්ඩ ගැමි වහරේ එන යෙදුම් වලින් හා වචනවලින් සරසා තිබීම එස්. කරු කලාකරුවාගේ තිර රචනයේ විශේෂත්වයක්. ඒ හා පැහුණ රංගනය හා අභිනය ජය ශ්‍රී කලාකරුවාගේ නිර්මාණ ශක්තිය විදහා පෑමක්. ඒ සඳහා අප අතර සිටින ගායක ගායිකාවන් පුහුණු කරවීමත් වෙනමම අභියෝග යක් වුවාට සැකයක් නෑ. මන්ද යත් ඔවුන් මෙල්බර්න් වේදිකාවේ ගී ගැයුමේ රඟපාමින් නොවන නිසාවෙන්. මින් පෙර මෙහි වේදිකා ගතවූ නාට්‍යවල ගායන වෘන්දයන්ගෙන් ලැබූ පුහුණුව වැඩි දියුණු සාර්ථක ලෙස වේදිකා ගතවන ලයනල් රන්වලයන්ගේ "ගම අවුලඤ්ඤං" ගැමි ගී ප්‍රසංගය සහ සහන් රන්වල කලාකරුවාගේ "යුද්දෙටත් ඇවිත් " ප්‍රසංගය සිහිපත් කරවීය. මෙම රංගනයත් එම ප්‍රසංගය සඳහා දායක වන ශිල්පීන් ඒ සඳහාම අධ්‍යාපනය ලැබ පුහුණුව ලැබුවත් නිසාවෙන් ඔවුන්ගේ හපන්කම් පිළිබඳව අරුමයක් නැති, එනයින් ඒ හා සසඳමෙන්ද පලක් නොවේ. තාක්ෂණයේ දියුණුව මෙවලම් කොට ගෙන පැල් කවි, පාරල කවි ගායනා වෙන අවස්ථාවලදී ඉතාමත් ම ප්‍රශංසනීයයි. ඕනෑම ගායනාවක හැඟිම් බර බව වඩාත් හොඳින් උද්දීපනය වන්නේ එම අදල පරිසරයේ දීයි. එම පරිසරය වේදිකාවයට ළං කරවීමට ගත් උත්සහය අපුරුයි.

සංගීත අධ්‍යක්ෂණයෙන් දයක වූ තරුපති මුණසිංහ තරුණ සංගීතවේදියාගේ හැඟිම් බර ජන ගී ගායනාවන්ද පසුබිමෙන් අසන්නට ලැබුණේ ප්‍රථම වතාවට. මේ සියල්ලක්ම ඉදිරිපත් කෙරුණේ සජීවීව වීමයි විශේෂත්වය. එදින මුණසිංහයන්ට අමතක නොවන දිනයක් වනු නොඅනුමානය. ඒ මන්ද යත් ඔහුට දුව පිය බිහිඳ වූ ගයනි ගිසන්තිකා රංගන ශිල්පිනිය පුත් රුවනක් එදින මෙලොවට දායාද කිරම නිසාවෙන් මවටත් පුතුරුත් නිරෝගී සුවයක් පියාට සුභාශිංසනයෙන් පැතීමට මින් ඉඩක් ලබාගනිමු.

"අර රජප්‍රුරුවෝ ගැන ලිව්වේ නැද්ද? "ඒ පින් ආයෙත් "ඔව් හැබෑව !" පන් ආයෙත් ලියන්න ගත්තා.

දෝලාකරුවන්ගේ ගී සහ කුණං ගී ඇසුරින් ලයනල් රන්වලයන් කළ ප්‍රතිනිර්මාණය "මිතුරු සරෝරුව" ගායනයේදී ප්‍රශස්ති හමුවේ රජතුමා දක්වන ප්‍රතිචාර අභිනයෙන් දැක්වීම මීට වඩා හොඳින් හමුවේ රජතුමා දක්වන ප්‍රතිචාර අභිනයෙන් දැක්වීම මීට වඩා හොඳින් ඉදිරිපත් කළ හැකිව තිබුණා ය යන්නයි අපගේ හැඟීම. රජතුමාගේ ගමන බිමන පවා තව දුරට වර්ධනය කල හැකිව තිබිණ. සිය මවගෙන් ගුටි කන, දෙස් අහන කුඩා පිරිමි දරුවාගේ අභිනය ඉතා සිත්ග න්නා සුළු විය. ඒ අනුව බලනකල ගායනා වෘන්දය ගයමින්ද නටමින්ද කළ අභිනයන් ප්‍රශංසනීයයි. හෙළ මියැසි රාවයට විටින් විට "රංගාභිෂේකය" යටතේ වුව ඉදිරිපත් කළ හැකිව තිබූ ගැමි නැටුම් එක්කිරම මුලු ප්‍රසංගයම එකිනෙක යා කළ හුයක් වන් විය.

දෙවන භාගයේ වේදිකා ගත වූ රංගාභිෂේක 2 ඇරඹුනේ "බුලත් පදය" නර්තනයෙන්. ජගත් මුණසිංහ නිවේදක වරයාගේ සටහන් අපහට සම්පත් සපයන්නේ දෙවන භාගයේදීයි. " කොහොඹ කංකාරියගේ පියවර හත අතුරින් පළමුවැන්නයි බුලත් පදය" සිංහලයේ මුල්ම රාජාධිනායකයෙකු වූ පඬුවස් දෙව් රජුගේ අසනීප තත්ත්වයක් මඟහරවාලීමට නිර්මාණය වුවද පසු කලෙක කොහොඹ යක් කංකාරිය මුල්ම අස්වැන්නේ දෙවියන්ට පිදෙන කොටස භාරගැනීමට දෙවියන්ට කෙරෙන ආරාධනාවක් ලෙසින්ය. පසු කලෙක ඉදිරිපත් කෙරුනේ අතෙහි බුලත් අතක් සහිතව කෙරෙන නර්තනය අතරේදී අප මව් බිමෙන් බැහැරව සිටක වග දැනුන එකම අංගය වුයේ වෙනත් වර්ගයක කොල ශිල්පිනියන්ගේ අතෙහි වූ බව දැකීමෙන් පමණකි.

"පුෂ්පාංජලී" නමින් ඉදිරිපත් කෙරුණා වූ " භාරත නාට්‍යම්" නර්ථනය දකුණු ඉන්දියානු නර්ථ න සම්ප්‍රදයන් එන විය හතෙන් එකකි. අනතුරුව ඉදිරිපත් කෙරුණේ මව් බිමේ පහතරට නර්ථනයකි. විශාරද එඩ්වඩ් ජයකොඩි ශිල්පියාණන් ගැයූ මුව මුක්ත ලතා" ගීයට අනුව කළ නර්ථනය ද ආකර්ශනීය විය.

තාල වාද භාණ්ඩයෙන් වැයෙන පදවලට අනුකූලව නර්ථනයේ පා තැබීම නිර්මාණය කිරීමත් ඒ අනුව වේගයෙන් නැටීමට පුහුණුකර තිබීමත් ප්‍රශංසනීයයි.

සබරගමු සම්ප්‍රදයේ එන පතුරු නැටුම රණ බිමට වන් විරුවන්ගේ මානසිකත්වය වර්ධනය කිරීමෙහිලා වැයෙන පංච තූර්ය වාදකයන් සමඟ දවුල් කරුවනට පසු වයින් ගමන් කිරීමට නිර්මාණය වුවකි. සියලු ශිල්පීන්ගේ නර්තන ඒකාග්‍රතාව වැදගත්වන මෙම නර්ථනය මින් පෙරදීද මෙල්බර්න් වේදිකාවේදී විඳ ඇත්තෙමු. පතුරු නැටුමට මෙන් ම ලී කෙළි නැටුමට ද එක් වූ විශාල සිසු සිසුවියන් ප්‍රමාණය අපගේ හද පුබුදුවාලන්නක් විය.

ආලෝකකරණය කළ ජගත් කොතලාවල ශිල්පියාගේ හපන්කම් මාධ්‍යයේ වේදිකාව සුර ලොවක් වන් විය. කුඩා දරු දැරියන්ගෙන් කොතලාවල සොයුරාගේ ශිල්පීය හරඹය මෙ නුවරට ආගන්තුක නොවේ. විවිධ නර්ථ නයන් වෙනුවෙන් ඔහු ඉදිරිපත් කළ ආලෝක රටා කුඩා දරුවන්ගේ ඉදිරිපත් කිරීම්වලදී තීව්‍ර වීය. චාමර නැටුම ඉන් එක් අවස්ථාවකි. රජුනට පවන් සැලීම අළෙලා පසුව සැකසුණ නර්ථ නයකි. "චාමර" නැටුම පසු කාලීනව එක් වුවද සබරගමු මහ සමන් දේවාලයේ "දික් ගෙඩි" නැටුමේදී දෙවියන්ට කන්නලව්වක් ලෙසින් මෙම නැටුම ඉදිරිපත් කෙරෙයි. ලී කෙළි නැටුම කුඩා ළමුන්ගේ ජන ක්‍රීඩාවකි.

"ඩබිලිව් ජයසිරි රංගනවේදියාණන් විසින් කරන කෙටි කෙදසයන්ගේ සංගීතයට අනුව ටී.එම්. ජයරත්න සහ අයිවෝ ඩෙනිස් ගායන ශිල්පීන් සහා සුනිලා අබේසේකර ශිල්පිනිය ධර්මසේන පතිරාජයන්ගේ "බඹරු ඇවිත්" චිත්‍රපටය සඳහා ගැයූ "උදුම්බරා හිනැහෙනවා" ගීය උදුම්බරා නර්ථනාචාර්යවරිය තමන්ගේම බවට නතු කරගන්නා සේයි. ඊට රංගන නර්ථනාචාර්යවරයා සහ අනෙකුත් පිරිසෙන් ලැබුණේ නොමඳ සහයක් ඊට පසුතල සැපයු දර්ශන පෙළත් ප්‍රශංසනීයයි. එහෙත් ඒවායින් ලාංකේය බව ඉස්මතු වී නම් මැනැවැයි හැඟේ. අපරදිග ආරයට ගැයෙන කසුන් කල්හාරයන්ගේ ප්‍රසංගයකට එවන් රූප රාමු ගැලපුණාද මෙවන් නිර්මාණයකට අවශ්‍ය සම්පත් අපගේ මව්බිමේ ඕනෑතරම් අති බැව් සිහිපත් කල යුතුයි. ගීයේ ගිටාරයට හා ගායක රටාවට අනුව රූපපෙළ තෝරා ගත්තා විය හැකියි. රත්න ශ්‍රී විජේසිංහයන් රචනා කරන ලදුව එච්.එම්. ජයවර්ධනයන්ගේ සංගීතයට ජානක වික්‍රමසිංහයන් ගැයූ "කිරුළ මුතු ලිහී" නම් වූ නර්ථන හා බේර් වාද්‍ය ශිල්පියාගේ යථාර්ය කියැවෙන ගීයට නව අරුතක් දෙමින් රංගන නර්ථන ශිල්පියාණන් කළ අභිනය මුසු නර්ථ නය අපගේ නෙත් තෙත් කරවීමට සමත් වුහ. පටු වාණිජ පරමාර්ථයන්ගෙන් තොරව තමන් සතු දැනුම ලොවට බෙදා දීමට කැප වුණ නැටුම් ගුරුන්නාන්සේ කෙනෙකුගේ චරිතය තමාගේම භූමිකාව කියා පෑමක් වීද?

ගජමන් නෝනාගේ චරිතය ඇසුරින් හා මිල්ටන් පෙරේරා ගායන ශිල්පියාණන්ගේ "රන් පොකුණෙන් දිය" ගීත සඳහා කල ඉදිරිපත් කිරීම් තවත් අංග දෙකක් පමණක් විණ. උඩරට සම්ප්‍රදයේ එන දහට වන්නම් සහ පහතරට සම්ප්‍රදයෙහි එන තිස් එක් වන්නම් අතුරින් එකක් වූ මයුරා වන්නම කතරගම දෙවියන්ගේ වාහනය වූ මොණරාගේ ඉරියව් ඇසුරින් නිර්මාණය වුවකි. ඒ සඳහා මෙහිදී ඉදිරිපත් කළ නිර්මාණයේ විශේෂය ලෙසින් දුටුවේ ඒ හා මුහු කළ නිදහස් නර්ථන ආරයි.

පාරම්පරික වෙස් නැටුම් හා හේරිවාදන අතරින් විශේෂයෙන් ආකර්ශනය ඇදී ගියේ කුඩා හම්මැරිටම් වාදක ශිල්පියාටයි. දැරයන් විශාල පිරිසක් සහභාගී වන නර්තන අංග අතරින් දුටු පිරිමි දරුවන් කීප දෙනාගෙන් අයෙකි ඒ.

සමස්ථයක් වශයෙන් ප්‍රශංසා කටයුතු මේ උත්සාහයේදී නව නිර්මාණකරණය පිලිබඳව විසිසිලිමත්ව තවදුරටත් උත්සාහ කරන්නේ නම් මැනැවැයි හැඟේ මෙවන් කාර්යයක ඇති අපහසුතාවය අපි මැනවින් දන්නෙමු. වාහනය පිළිබඳව හසල දැනුමක් නැති වුවද හුදෙක් රසිකයෙක් ලෙසින් පමණකි මේ පසු දැක්ම ලියාවුණේ.

මේ හා සමානවම තම කුසලතා බෙද හදා දෙන අන් ශිල්පී ශිල්පියන්ගේ කටයුතු පිළිබඳව ද ඉඩලද විටෙක සටහන් තැබීමට කැමැත්තෙමු. රසිකා කුලසිංහ ආචාර්යවරියගේ විශ්ව රංගායතනයෙන් ඉදිරිපත් කෙරුණ "විශ්ව නර්තන රෙඩා 2007" පිළිබඳව අප සටහන් තැබීමු. අමා සිරිවර්ධන ආචාර්යවරියකි. "අමා දහර" සහ "දිනේෂ් අපසිංහ" ආචාර්යවරයා-ගේ "මදුරාභිරංගන" අප හට මඟ හැරුණ. ලැබෙන ඉඩකඩ අනුව ප්‍රේක්ෂකාගාරයේ සාමාන්‍ය රසිකයෙකු ලෙසින් ඔවුන්ගේ හපන්කම් ද දකින්නට අදහස් කරන්නෙමු.

සිසිර දිසානායක